**දළ විශ්ලේෂණය (Overview)**

ඒතීරියස් සංසදය (Aetherius Society) යනු ලෝකය පුරා පැතිරීගිය මනුෂ්‍ය වර්ගයාගේ අවබෝධත්වය සහ මුදවාගැනිම සඳහාම කැපවුනු ආද්ධ්‍යාත්මික සංසදයකි.

මෙම සංසදය ප්‍රතිස්ථාපනය කරන ලද්දේ වර්ශ 1955 දි නැසිගිය අපරදිග යෝග විශාරද මහචාර්ය ජෝර්ජ් කින්ග් විසිනි. මෙලොවින් සහ මෙලොවින් එපිටට ගිය උසස් බුද්ධීන් මගින් මහචාර්ය තුමාට යෝගි ආරුඪ වීම් හරහා ප්‍රඥාව (wisdom) ලබාගෙන ඇත . එබැවින් සංසදයේ ප්‍රධාන ඉගැන්වීම් ක්‍රම අන්තර්ගත වන්නේ මහාචාර්ය තුමාගේ යෝග ආරුඪ වීම් හරහා ලබාගත් ප්‍රඥාව හරහායි.

මෙම විශේෂ ප්‍රඥාව අතීතයේ මෙලොව විසු ශ්‍රේෂ්ඨ මහපෙන්වන්නන්, එනම් ගෞතම බුදුහාමුදුරුවෝ , ශ්‍රී ක්‍රිෂ්ණා, ජේසු උතුමාණන් වැනි මහ පෙන්නන්ගේ ඉගැන්වීම් වලට සමාන කිරීමක් සිදු නොකරයි. නමුත් මෙම ඉගැන්වීම් සුළු වශයෙන් අන්තරීක්ෂ මට්ටමට, එනම් මෙලොවින් එපිටට ගෙනියනවා.

ඇත්තවශයෙන්ම සංසදයේ ප්‍රධාන ඇදහිලි වලින් විශ්වාශ කරනවා ලෝකයට බිහිවුන නායකයන් අතරින් බොහෝ දෙනෙක් මෙලොවට බිහිවුනේ වෙනත් ග්‍රහ ලෝක වලින් බව.

සංසදයේ ඍජු දර්ශනය වන්නේ අන්‍යන් සඳහා පරාර්ථකාමි සේවයක් යන්නයි.

සංසදයේ ආදර්ශ පාඨය වන්නේ,

“Service is the jewel in the rock of attainment.”

( “ලබාගත් දෙයක ආභරණය සේවයයි”)

අවබෝධය සහ මුදවාගැනිමට තිබෙන එකම මාර්ගය තමන් බව සංසදය නොතකයි. එය තරයේ කියා සිටිනවා. සියලුම උසස් ආගම් යනු එක් සුවිශේෂි අකල් සත්‍යකින් සුළු වශයෙන් වෙනස් පැහදිලි කිරිම් බවයි. එම යතාර්ථය නම් දෙවියන්ගෙ මුලාශ්‍රයයි.

සංසදයේ සලකුණේ තේරුම වන්නේ දෙවියන් ඔහු විසින් ප්‍රඥාව ලෙස ප්‍රත්‍යක්ෂ වීමයි. වම් පස තිබෙන පුජනීය සලකුණ දෙවියන් සඳහා වේ.

දකුණු පස තිබෙන ත්‍රිකෝණ සලකුණෙන් ප්‍රඥාව පෙන්නුම් කරයි.

**යෝග (yoga)**

නිරෝගීව සහ ශක්ති සමපන්නව සිටිමේ මාර්ගයක් ලෙසත්,ලිහිල් කිරිමෙ ශිල්ප ක්‍රමයක් ලෙසත්, අවබෝධය සඳහා ඉතා පෞරාණික ගැඹුරු මාර්ගයක් ලෙසත් යෝග හැඳින්වේ.

**ආද්ධ්‍යාත්මික ශක්තිය, යාතිකාව, සහ සුව කිරිම.(Spiritual energy, prayer, healing)**

ආද්ධ්‍යාත්මික ශක්තිය විද්‍යුතයට වඩා සුලුවශයෙන් හෝ අඩු නොවුවත් ස්වභාදහමේ නීති වලට අනුව ක්‍රියා කරයි. මෙම ශක්තියට හැකියාව තිබෙනවා සුවකිරිමට, මග පෙන්වීමට, පෙලඹවීමට, ආශිර්වාද කිරීමට සහ එය තුලට කාවැදුනු ඕනෑම කෙනෙක් ආරක්ශා කිරිමට.

අපට ඉගෙනගැනිමට හැකියාව තිබෙනවා ආයාචනා කිරිමට මෙම ආලෝක ශක්තිය, මෙම ආදර බලය, පරිවර්තනය කර අපිටම උදවු කරගත හකි අයුරින්. එමෙන්ම ප්‍රධාන ලෙසම මුලු ලෝකයම සමස්තයක් ලෙස ගැනිමට.

වේගවත් යාතිකාව මගින් අද්ධ්‍යාත්මික ශක්තිය ආකර්ශනය කර එය ඒකට එකතු කර එක් ස්ථානයකට නාභි ගත කර යොමු කරනවා නිශ්චිත වෙනස් වීමකට.

මන්තර- එනම් ශුද්ධ වු රාවයන්ගෙ ගායනය, මෙයද එක් මාර්ගයක්, මෙම ගුප්ත ශක්තිය පරිවර්තනය කිරීමට.

**දේව අන්තර්ගතය (Divine within)**

අප සියලු දෙනාගෙම සර්වසියලුම මැවීම් දිව්‍යමයි. යථාර්තය වන්නෙ සියලුම මැවීම් කර තිබෙන්නේ දෙවියන් විසින් බවයි.

අපි සියලු දෙනාම පැමිනෙන්නෙ දෙවියන්ගෙ මුලාශ්‍රයෙන්. ඒ වගේම අපි නැවත ඒ කරා නිරායාසයෙන්ම යනු ලබනවා. එය විවිධ නම් වලින් හදුන්වනු ලබනවා -දෙවියන්, බ්‍රහ්ම , ඉන් කිහිපයකි. තවද එය විවිධ ආගම් විවිධ ඇදහිලි මගින් නොයෙකුත් ආකාරයෙන් පැහැදිලි කරනු ලබනවා.

එය සදාකාලිකයි. සියලුම ශක්තීන්ගෙන් සහ සියලුම දැනගනීම් වලින් උක්තයි. එය හැමතැනම පවතිනවා. එමෙන්ම සියලුම දෙය එයයි. ඇත්තෙන්ම එය ඊටත් වඩා එහාට ගිය වැඩි යමක්.

අපගේ අත් දැකීම් හරහා අපගේ සංසාර ගමන නිවැරදි ලෙස යාත්‍ර කිරීමෙන් අපි සකස්කර ගන්නව සහ අපගෙ දැනුම වැඩි වෙනවා , අපේ ස්වභාවික දිව්‍යමය පරිසර පිලිබඳව.

**අන්තර්ඥානය සහ චිත්ත බලය (Intuition, psychic powers)**

අප සියලු දෙනාටම හැකියාව තිබෙනවා අපගේ අන්තර්ඥානය හා චිත්තබලය විවිධ ශිල්ප ක්‍රම හරහා වැඩි දියුණු කරගැනිමට.

**විශ්වයෙන් පරිබාහිර වූ ජීවිතය (Extra-terrestrial life)**

අපගේ සෞරග්‍රහ මණ්ඩලය තුල උසස් ශිෂ්ටාචාර පවතිනවා. අප දන්න තරමින් විද්‍යාව අනාවරණය කරගෙන නැහැ මෙම ජීවින් පිළිබඳව.

ඔවුන්ගේ ආද්ධ්‍යාත්මික උසස් පරිණාමය නිසා එතීරියස් සංසදය ඔවුන්ව නම් කර තිබෙනවා විශ්ව දෙවියන් ලෙස.

මහ කාරුණිකත්වය සහ ඔවුන්ගෙ කැපවීම මත මෙලොව සිටින මනුෂ්‍ය වර්ගයාට ඔවුන් අනේකවිධ අයුරින් ඔවුන්ව මුදවා ගැනීමට උපකා කර ඇත. මෙලොව ඔවුන් නොමැතිනම් අප සහ මෙම ලෝකය ල නැසී ගොස් බොහො කල්.

ඇතැම් විශ්ව ඊශ්වරයන් අප අතරින් මනුෂ්‍ය ජීවිත තෝරගෙන තිබෙනවා ඔවුන් මෙම විශේෂ ඉගැන්වීම් ක්‍රම කියා දීමට. ගෞතම බුදුහාමුදුරුවෝ, ජේසු උතුමාණන්, ශ්‍රී පටන්ජලී සහ ශ්‍රී ක්‍රිෂ්ණා එවැනි චරිත වේ.

මෙම ඊශ්වර දෙවියන්ට එතීරියස් සංසදය සෘජු ලෙසම සහය දක්වනවා යතිකා බල මෙහෙයුමත් අන්තර්ගතව පංච විශ්ව දූත මෙහෙවරයන් හරහා.

උසස් බුද්ධිමත් ජීවින් අපගේ සෞරග්‍රහ මන්ඩලයෙන් ඔබ්බටත් සිටිනවා. එම සමහරෙක් ජීවින් අපටත් වඩා උසස් බුද්ධියෙන් යුක්ත වන අතරම තව සමහරු අපට වඩා බුද්ධියෙන් පහත්. සමහර ජීවින් අපට හිතකර නමුත් සමහර ජීවින් සතුරන් ලෙස ක්‍රියා කරනවා.

**හඳුනා නොගත් පියාසර වස්තු (UFO)**

UFO හඳුනා නොගත් පියාසර වස්තු ලෙස හඳුන්වන යානා සමහරු නම් කර තිබෙනවා පිටසක්වල ජීවින්ගෙ අභ්‍යවකාශ යානා ලෙස ඔවුන් පෘතුවියට පැමින තිබෙනවා සහශ්‍ර වර්ශ ගණනක් තිස්සේ. ශුද්ධ වූ බයිබලයේ ද ඔවුන්ව විස්තර කරනවා 'වලාකුළු', 'තරු', සහ 'පියාඹන ලියවැල්' ලෙස සහ හින්දු ආගමේ විශේෂ නමක් සඳහන් වෙනවා "විමන" ලෙස.

**කර්මය සහ පුනර්භවය (Karma and rebirth)**

කර්මය යනු දඬුවම පිලිබඳවම නොවේ. නමුත් ඉගෙනගැනිම පිලිබඳවයි. කර්මය යනු එක් විශිෂ්ට ඊශ්වර දෙවියෙක්. එය අපට පාඩම් කිය දෙනවා අද්ධ්‍යාත්මික පරිණාමය හරහා අපගෙ සංසාර ගමන උසස් කර ගැනිමට. පුනර්භවය අතර තුර අපි ගතකරනමවා යම් කාලයක් වෙනත් තලයක. මෙය පෘතුවියේ කොටසක් වුවත් පවතින්නේ වෙනත් සංක්‍යාන මට්ටමක.

මිනිසුන්ගෙ අයහපත් හැසිරිම නිසා ,නරක සිතුවිලි නිසා ලෝක කර්මයෙහි සමතුලිතතාව වර්තමානය වන විට බිඳ වැටී තිබෙනවා එය හරියට ප්‍රධාන නගරයක තිබෙන විවෘත ඉඩමක් වගේ.

**කුණ්ඩලිනි, චක්ක්‍රා සහ රැස් මඬල (Kundalini, chakras and auras)**

අප සියලු දෙනාටම තිබෙනවා  රශ්මි වළල්ලක්, එය අපට දිස් උනත් නැතත් එය දැනුනත් නැතත්.

රශ්මි වළල්ල හැදිලා  තිබෙන්නෙ ශාරිරික ධාතුන් වලටත් වඩා සියුම් ධාතු වලින්. නමුත් ඒකෙන් අදහස් කෙරෙන්නෑ මෙය ශාරිරක හෝ සත්‍යයක් නොවන බව එය පැහදිලිවම ශාරිරිකයි, නමුත් වෙනත් අයුරකින්.

මෙම සියුම් ශක්තින් චක්ක්‍රාරව අප තුලට සහ අපෙන් පිටතට ගලා යනවා . මෙය ශරිරයේ  කේන්ද්‍රස්ථානය කියලත් හඳුන්වනවා. අපගේ කොඳු නාරටිය දඬුවක් ලෙස ගත් විට එය වටා ඇති චක්‍රයන්, ශරිරය හරහා එයින් හටගන්න මල් වගෙයි.

කුන්ඩලිනි යන ගුප්ත බලය පිහිට තිබෙන්නේ මෙම කොඳුනාරටියේ පාදම යේ ය, සමහර වෙලාවට එය සර්පයෙකුගෙ බලයක් ලෙසද යොමු කරනවා . මෙම ශක්තියෙ ඉහල යාම කොඳුනාරටිය හරහා එක එක චක්ක්‍රා වල සක්‍රිය කිරිමට බලපායි. එමෙන්ම අවබෝධයට හා විශ්ව විඥානයට බලපායි. කුන්ඩලිනි ශක්තියේ  ඉහලයාමේ  බලපෑම ඉතා භයානක වන අතර එතීරියස්  සංසඳය විසින් එය නිර්දෙශ නොකරයි. කෙසේනමුත් අන්‍යන් උපකාර කිරීම තුලින් කුන්ඩලිනි ස්වභාවිකවම වැඩිදියුනුවන අතර එහි හැඩයට බලපෑමක් අති නොවෙයි.

**අරූඪ  දෙවිවරු (Ascended Masters)**

පෘතුවියේ සිටින මිනිසුන් භවයක් ලබන්නේ කර්මයට අනුවය .ඒ  සඳහා ඔවුන් ආද්ධ්‍යාත්මික ව සැකසෙනවා. .පුනර්භවය ප්‍රදාන චක්‍රය ලෙස ගත් විට එක් එක්  පුද්ගලයාට තිබෙනවා තොර ගැනීමක් වෙනත් උසස් ලෝකයක භවයක් ලබගන්නවාද නැතහොත් නැවත පෘතුවියවියේම ආරූඪ දෙවියෙක් ලෙස  භවයක් ලබනවද කියා

**පෘතුවි මාතෘ භූමිය (Mother Earth)**

මාතෘ භූමිය යනු ජීවත් වන දෙව් දුවකි ඇ ය අගේ කාර්යයන් පරදුවට තබා  මිනිස් වර්ගයට සඳහා ඉඩ දී තිබෙනවා ඔවුන්ගේ නිවහන ලෙස.ඇගේ මෙම ශ්‍රේෂ්ඨ පරිත්‍යාගයට  එතේරියස් සංසඳය විවිද මාර්ග වලින් උපකාර කරනවා.

**පූජනීය කඳු (Holy Mountains)**

එතිර්යස් සංසදය වර්ෂයකට වතාවක් පූජනීය කඳු වන්දනා මාන කිරීම සඳහා චාරිකා සංවිධානය කරනු ලබයි   එම කඳු වල යාතිකා සහ මන්ත්‍ර  වලින් එකතු වූ කිරණ මඟින් පූජනීය කඳු අන්තර් ගත වෙනවා.

මෙම පූජනීය කඳු ආරෝපණය කරනු ලබන්නේ විශ්ව බුද්ධීන් සහ ආරූඪ දෙවිවරු විසිනි ,මෙය ස්ටාර් ලයිට් මෙහෙයුම මගින් සිදු කරනු ලබයි මෙම මෙහෙයුම නිසා මහාචාර්ය තුමා වසර තුනකටත් අඩු කාලයකින් ලෝකය පුරාම ඇති පූජනීය කඳු වන්දනා මාන කර ඇත.

වැඩි දුර විස්තර සඳහා කරුණාකර මෙම විද්‍යුත් ලිපිනය හා සම්බන්ධ වන්න info.sinhala@aetherius.co.uk